# ඊශ්‍රායල් පන්සලේ පිංකමක්

ඊශ්‍රායල් බෞද්ධ මද්‍යස්ථානයට ශ්‍රී ලංකාවෙන් ධාතු කරඬුවක් වැඩම කරවීමේ පිංකම පසුගිය 18 වෙනි සෙනසුරාදා එම මද්‍යස්ථානයේදී, කරවිලකොටුවේ ධම්මතිලක හිමියන්ගේ සහ ඊශ්‍රායෙල් ජාතික හිමිවරුන් දෙනමකගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

බෞද්ධ සහ බෞද්ධ නොවන විශාල පිරිසක් ඊට සහභාගි වූහ.

ඊශ්‍රායලයේ ශ්‍රී ලංකා තානාපති සරත් විජේසිංහ මහතා සහ එම මැතිණිය, නියෝජ්‍ය තානාපති මේජර් ජනරාල් ජගත් අල්විස් සහ තානාපති කාර්යාලයීය කාර්ය මණ්ඩලයද, නේපාල සහ මියන්මාර් තානාපති නිලධරයෝ සහ ඊශ්‍රායල ජාතිකයෝ පිරිසක්ද සහභාගි වූහ.

බෞද්ධ දර්ශනය පිළිබඳ උනන්දුවක් දක්වන විදේශිකයන්හට තානාපති සරත් විජේසිංහ මහතා බෞද්ධ පොත්පත් තෑගිකළේය.